**නීති පීඨය**
**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
තැ.පෙ 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව

දුරකථන අංක : 0094112500942
පීඨාධිපති සෘජු දුරකථන අංකය : 0094112502001
නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති පීඨය) දුරකථන අංකය : 0094112590556

2017 නොවැම්බර් 01

**දයාබර ශිෂ්‍ය ශිෂ්‍යාවනි,**

ඔබට අපේ සුභ පැතුම්! කීර්තිමත් කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ සිව් වසරක උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ඔබව තෝරා ගෙන ඇත. මෙම පාඨමාලාවේ සමාරම්භය සහ පහත දැක්වෙන ක්‍රියාකාරකම් පහත දැක්වෙන දිනවල පැවැත්වේ. සියලුම ක්‍රියාකාරකම් කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවත පිහිටි නීති පීඨයේ බිම් මහලේ පැවැත්වේ. **පහත දැක්වෙන සියලුම අවස්ථාවන්ට ඔබේ පැමිණීම සහ සහභාගී වීම අනිවාර්ය බව අවධාරණය කරමු.**

**2017 නොවැම්බර් 16, පෙ.ව 9.00 සිට** - 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා උපාධි අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම
**2017 නොවැම්බර් 16, පෙ.ව 9.00 සිට මධ්‍යාහන 12.00 දක්වා** - දෙමාපිය හමුව

සියලුම දෙමාපියන් පෙ.ව 9.00ට පෙර නීති පීඨ පරිශ්‍රයට පැමිණ සිටිය යුතුය. **එක් උපාධි අපේක්ෂකයෙකුගේ දෙමාපියන් /භාරකරුවන් දෙදෙනෙකු සඳහා පමණක් දෙමාපිය හමුවට සහභාගී වීමට අවසර ලබා දී ඇත.** මෙම ලිපිය සමඟ එවනු ලබන 'විශේෂ අවසර පත්‍රය' ඔබ විසින් රැගෙන ආ යුතු අතර ශාලාවට ඇතුල් වීමේදී එය ඉදිරිපත් කළ යුතුය.

**<u>දෙමාපිය හමුව සහ ලියාපදිංචිය අවසානයේ සිසුන් නිවෙස් කරා (විශ්ව විද්‍යාලයේ නේවාසිකාගාරයන්ට නොව) ආපසු යා යුතුය.</u>**

**2017 නොවැම්බර් 20, පෙ.ව 9.00 සිට** - පිළිගැනීමේ උත්සවය සහ දිශානතිමුඛ කිරීමේ වැඩසටහන ආරම්භ වේ. දිශානතිමුඛ කිරීමේ වැඩසටහන 2017 නොවැම්බර් 30 දින දක්වා පැවැත්වේ.

**2017 නොවැම්බර් 20, පෙ.ව 9.00 සිට මධ්‍යාහන 12.00 දක්වා**- ඉංග්‍රීසි භාෂා ස්ථාපන පරීක්ෂණය පැවැත්වේ.

නේවාසිකාගාර පහසුකම් ලැබෙන සිසුන් අදාළ නේවාසිකාගාරයන්ට **2017** නොවැම්බර් 20 ප.ව 4.00 ට රැගෙන යනු ඇත.

**2017 දෙසැම්බර් 04** - දේශන ආරම්භ වේ.

නීති පීඨය තුළ අර්ථවත් සහ ඵලදායී අධ්‍යාපනයක් හැදෑරීම උදෙසා ඔබට සුභ පැතීමට අපි මෙය අවස්ථාවක් කොට ගනිමු.

මෙයට විශ්වාසනීය,

ආචාර්ය ශාන්ති සෙගරාජසිංහම්
අංශ ප්‍රධානී, වාණිජ නීති අධ්‍යනාංශය, දිශානතිමුඛ කිරීමේ වැඩසටහන් කමිටුව වෙනුවෙන්
නීති පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය